ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

# මාධ්‍ය නිවේදනය

කොළඹ රාජකීය විද්‍යාලයේ 11 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුවෙකුට එම විද්‍යාලයේ ගුරුවරුන් දෙදෙනෙකු විසින් අමානුෂික ලෙස පහරදීම සම්බන්ධයෙන් වූ පැමිණිලි විභාගය අද දින එනම් 2022.11.14 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේදී කැඳවන ලදී. එහිදී රාජකීය විද්‍යාලයේ විදුහල්පතිවරයා කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කරන ලද්දේ මින් ඉදිරියට කොළඹ රාජකීය විද්‍යාලය තුළ කිසිදු ආකාරයක ශාරීරික හෝ මානසික වධහිංසා සිදුවීමට ඉඩ ලබානොදෙන බවත්, එම වධහිංසා පාසල තුළින් තුරන් කරන බවයි. තවද පාසල් තුල විනය ආරක්ෂා කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් හඳුන්වාදී ඇති 12/16 චක්‍රලේඛය ගුරුවරුන්ගේ විවේකාගාරවල ප්‍රදර්ශනය කිරීමට පියවර ගන්නා බවට විදුහල්පතිවරයා කොමිෂන් සභාව ඉදිරියේ පොරොන්දු විය.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පාසල තුළ විනය ආරක්ෂා කිරීම සඳහා හඳුන්වාදී ඇති 12/16 චක්‍රලේඛය පිළිබඳ සෙසු පාසල් දැනුවත් කිරීමේ අවශ්‍යතාවය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත අවධාරණය කරනු ලැබේ.

මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

2022.11.14